# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1832/27 - 2013 ඔක්තෝබර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

ජනා. කා. අංකය : සීඑස්ජ්/1/16/1.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(1) වැනි ව්‍යවස්ථාව යටතේ අමාත්‍යවරුන් පත්කිරීමට අදාළව 2013 ජනවාරි මස 31 වැනි දිනැති අංක 1795/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2013 අංක 22/2 දරන නිවේදනය, 2013 ඔක්තෝබර් මස 15 වැනි දින සිට පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | *නම* | *විෂයය* |
|---|---|---|
| 1. | ගරු රෝහිත පියතිස්ස අබේගුණවර්ධන මැතිතුමා, පා. ම. | මහාමාර්ග, වරාය හා නාවික |
| 2. | ගරු නිර්මල කොතලාවල මැතිතුමා, පා. ම. | මහාමාර්ග, වරාය හා නාවික |

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

2013 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

11-148/1

1A - PG 001799— 650 (2013/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නිවේදන

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

### නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)(අ) වැනි අනු ව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2010 නොවැම්බර් මස 22 වැනි දිනැති 1681/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2013 ඔක්තෝබර් මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

(1) එම නිවේදනයෙහි වරාය හා මහාමාර්ග අමාත්‍ය (අංක 3) ශීර්ෂය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් :-

(අ) එම ශීර්ෂය "(3) මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍ය" වශයෙන් ;

(2) එම නිවේදනයෙහි සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍ය (අංක 47) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "වී අලෙවි මණ්ඩල පනත යන අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් :-

"ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත (1980 අංක 41)" ;

(3) එම නිවේදනයෙහි විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය (අංක 61) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003 අංක 27)" යන අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් :-

"ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත (2006 අංක 19)" ;.

11-148/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.